2024.11.07 පිටු 1, 2

මව්බිම

# තනි කෙනකුට අවම අවශ්‍යතා සඳහා මසකට 16,000ක් ඕනෑ

අමිල අබේරත්න

සිය මූලික අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා අවම වශයෙන් එක් පුද්ගලයකුට මසකට රුපියල් දාසය දහස් එකසිය පනස් දෙකක් (රුපියල් 16,152) අවශ්‍ය වන බව ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව ප්‍රකාශ කරයි.

▶2 පිටුවට

## තනි කෙනකුට...

මෙරට දුප්පත්කම සම්බන්ධයෙන් ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව නිකුත් කළ නවතම වාර්තාවක් මඟින් එලෙස ප්‍රකාශ කරයි.

එම වාර්තාවට අනුව කොළඹ ප්‍රදේශයේ ජීවත්වන අයකුට සිය මූලික අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා රුපියල් 17,420ක මුදලක් මසකට අවශ්‍ය වන අතර අඩුම මුදලක් අවශ්‍ය වන්නේ මොනරාගල ප්‍රදේශයේ ජීවත්වන අයකුට වේ. එය රුපියල් 15,444කි.

ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව ප්‍රකාශ කරන පරිදි අවශ්‍ය එම මුදල සිය මූලික අවශ්‍යතා සඳහා පමණක් වන අතර විනෝදාස්වාදය හෝ අමතර වියදම් සඳහා හෝ ඉතිරි කිරීම සඳහා නොවේ.

ඔවුන් එම වාර්තාව මඟින් පෙන්වා දී ඇත්තේ දරිද්‍රතාවෙන් පෙළෙන පුද්ගලයකුට සිය මූලික අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා අවම වශයෙන් රුපියල් 16,152ක මුදලක් අවශ්‍ය වන බවය.

මෙරට ඇති සමහර ආයතන මසකට රුපියල් 26,000ත් 30,000ත් අතර මුදලක් සේවකයන් හට වැටුප් ලෙස ගෙවන බවට හා නිසි වේලාවට අදාළ වැටුප් නොගෙවන බවටද තොරතුරු වාර්තා වන අතර එම හේතුව මත මෙරට බොහෝ පවුල්වලට ආර්ථික දුෂ්කරතා ඇති වී ඇති බවද එම හේතුව මත බොහෝ පවුල් සංස්ථා කඩා වැටී ඇති බවටද තොරතුරු වාර්තා වේ.

එවැනි වැටුප් ලබාගන්නා ඇතැම් පිරිස් තුන්වේලකින් දෙවේලක් පමණක් ආහාර ලබාගෙන සිය ජීවිකාව ගෙන යන බවටද තොරතුරු වාර්තා වන අතර සමහර ආයතන ඉතා අඩු වැටුප් ගෙවීම මත එවැනි ආයතනවල සේවය කරන්නන් හට රැකියා කිහිපයක් කිරීමට සිදු වී ඇති බවද තොරතුරු වාර්තා වේ.

මේ අතර සමහර ආයතන සිය සේවකයන්ට ගෙවනු ලබන්නේ 2015 සහ 2016 යන වසරේ ලබාදුන් වැටුප් ප්‍රමාණය වන බවටද තොරතුරු වාර්තා වෙනු ලැබේ.